# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1687/27 - 2011 ජනවාරි 05 වැනි බදාදා - 2011.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මහනුවර මහ නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන මහනුවර මහ නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සදාසිවම් සසිකුමාර් නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ මහනුවර මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන තුඹානේ ත්‍රිභුවන කීර්තිසිංහ දුනුවීර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මහනුවර මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි යූ. අමරදාස වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, තුඹානේ ත්‍රිභුවන කීර්තිසිංහ දුනුවීර මහතා මහනුවර මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

යූ. අමරදාස,<br>
තේරීම්භාර නිලධාරි,<br>
මහනුවර මහ නගර සභාව.

2011 ජනවාරි මස 03 වැනි දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
මහනුවර.

01 - 398

1A - G 12042 — 345 (2011/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.